සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

09 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 14 S I

**කතෝලික ධර්මය - I** | කාලය පැය දෙකයි

සැලකිය යුතුයි :- ●වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පුරාණ ගිවිසුමේ පළමු පොත් පහ හඳුන්වන්නේ,
(i) පංච පුස්තකය (ii) ඉතිහාස පොත් (iii) ප්‍රඥා සාහිත්‍යය (iv) දිවැසිවර ග්‍රන්ථ

02. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙන් පසුව මුල් කිතුනු සභාව ආරම්භ වී වර්ධනය වූ ආකාරය දැක්වෙන්නේ,
(i) එළිදරව්ව පොතේ (ii) උත්පත්ති පොතේ (iii) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ (iv) රෝම ලිපියේ

03. සාම්ප්‍රදායිකව ගීතාවලියෙහි කතෘ ලෙස සලකනු ලබන්නේ,
(i) සලමොන් රජුය (ii) දාවිත් රජුය (iii) සාවුල් රජුය (iv) සාමුවෙල් රජුය

04. යාච්ඤාමය ගීතිකා 150 ක එකතුවකින් යුත් ශුද්ධ බයිබලයේ ඇති ග්‍රන්ථයක් වනුයේ,
(i) විරාවලිය (ii) ගීතාවලිය (iii) දිවැසාවලිය (iv) හිතෝපදේශය

05. දුක්ප්‍රාප්තියේ ශුභාරංචිය ලෙසින් හඳුන්වන්නේ,
(i) මතෙව් ශුභාරංචිය (ii) ජෝහාන් ශුභාරංචිය (iii) ලූක් ශුභාරංචිය (iv) මාක් ශුභාරංචිය

06. දෙවියන් වහන්සේ කායින් පිට තැබූ "සලකුණ"දණ්ඩනයේ නොව ............. ලාංඡනයකි. හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර වන්නේ,
(i) දේව ආදරයේ (ii) දේව රැකවරණයේ (iii) දේව දයාවේ (iv) දේව බලයේ

07. නව මැවිල්ලේ ආරම්භකයා ලෙස දෙවියන් වහන්සේ තෝරා ගනු ලබන්නේ,
(i) ආදම්ය (ii) ආබ්‍රහම්ය (iii) නෝවාය (iv) මෝසෙස්ය

08. ශුද්ධ බයිබලයේ වීර නායකයින් ගණන වනුයේ,
(i) 6 කි (ii) 16 කි (iii) 10 කි (iv) 12 කි

09. ඊශ්‍රායෙල් ඉතිහාසයේ මුලින්ම පිලිස්තිවරුන් සමග සටන් කර මරණයට පත් වූ රජතුමා වන්නේ,
(i) සලමොන් රජතුමා (ii) දාවිත් රජතුමා (iii) ජෝබෝවාම් රජතුමා (iv) සාවුල් රජතුමා

10. අප විසින් දියුණු කරගත යුතු ධර්ම ගුණයක් වන්නේ,
(i) රාගය (ii) උඩඟුව (iii) මිථ්‍යාචාරය (iv) කෑදරය

11. A. මව මොනිකාය B. පියා කතෝලිකයෙකි C. දක්ෂ කථිකයෙකි D. ඇල්බේනියාවේ උපත ලැබීය
ඉහත කරුණු අතරින් ශු. අගොස්තිනු මුනිතුමාට අදාළ කරුණු වන්නේ,
(i) AB (ii) CD (iii) AC (iv) BD

12. අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම් අනුව රෝගීන් ආලේප කරනු ලබන්නේ,
(i) පූජාප්‍රසාදීන් (ii) සභා මූලිකයන් (iii) තේවාචාරිවරුන් (iv) රදගුරුතුමන්

13. රෝගීන් ආලේප කිරීමේ තෛලයෙන්, ආලේප කරනු ලබන්නේ,
(i) නළල හා දෑත් (ii) නළල හා දෙපා (iii) දෑත් හා පපුව (iv) නළල හා පපුව

14. දෙවියන් වහන්සේ අප වෙත පවරා ඇති ජීවිතයේ හිමිකරුවෝ අපි නොවෙමු. අපි ගබඩාකරුවන් පමණක් වෙමු." මෙලෙස සඳහන් වන්නේ,
(i) උත්පත්ති පොතේ (ii) කතෝලික සභා ධර්මෝපදේශයෙහි
(iii) මතෙව් ශුභාරංචියෙහි (iv) ගීතාවලියෙහි

15. ශුභාරංචි ග්‍රන්ථයන්හි දැක්වෙන පරිදි මිනී මරණ කවරෙකු වුවද යටත් වනුයේ,
(i) අධිකරණයට (ii) ශ්‍රේෂ්ඨාධිකරණයට (iii) නිරා ගින්නට (iv) විනිශ්චයට

16. ක්‍රිස්තුන් වහන්සේ සිදු කළ ප්‍රථම ප්‍රාතිහාර්ය වනුයේ,
(i) අංශභාග රෝගීන් සුව කිරීම (ii) ලාසරස් මරණින් නැගිටු වීම
(iii) කුදු ස්ත්‍රිය සුව කිරීම (iv) කානා නුවර වතුර මිදි රසට හැරවීම

17. ශුද්ධ වූ සභා මාතාව ජනවාරි 21 වන දින සමරන මංගල්‍යය වනුයේ,
(i) ශු. ඇග්නස් මුනිතුමියගේ මංගල්‍යය (ii) ශු. ජුසේවාස් මුනිතුමාගේ මංගල්‍යය
(iii) ශු. දොමිනික් සාවියෝ මුනිතුමාගේ මංගල්‍යය (iv) ශු. පේදුරු තුමාගේ මංගල්‍යය

18. කාර්මේල් කන්ද මත දෙවියන් වහන්සේට පූජාසනයක් ඉදිකර යාග පූජා ඔප්පු කරන ලද්දේ,
(i) එලිෂා දිවැසිවරයා (ii) නාතාන් දිවැසිවරයා (iii) එලිසා දිවැසිවරයා (iv) සාමුවෙල් දිවැසිවරයා

19. "ඔබේ මේ සෙනඟ විනිශ්චය කරන පිණිස හොඳ නරක දැනගන්න පුළුවන් වන ලෙස ඥානවන්ත සිතක් ඔබේ දාසයාට දුන මැනවි" මෙලෙස දෙවියන් වහන්සේට යාච්ඤා කරන ලද්දේ,
(i) සලමොන් රජු (ii) දාවිත් රජු (iii) සාවුල් රජු (iv) රෙහෙබෝවාම් රජු

20. ආසියාතික රටවල රදගුරු තුමන්ලාගේ සාංඝිකත්වයේ හා ගැඹුරු භාවනාත්මක මෙනෙහි කිරීමේ ප්‍රතිඵලයක් වන්නේ,
(i) කිතුනු ඒකක (ii) අසිපා ක්‍රමය (iii) ශුද්ධ වූ පැය (iv) ජපමාල භක්තිය

(2 x 20 = 40)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01. i. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ 2 ක් නම් කරන්න
ii. ගීතාවලිය ග්‍රන්ථය හඳුන්වන වෙනත් නම් 2 ක් ලියන්න
iii. මතෙව් ශුභාරංචිය හඳුන්වන වෙනත් නම් 2 ක් ලියන්න
iv. දෙවියන් වහන්සේ සර්පයාට දුන් දඬුවම් 2 ක ලියන්න
v. කර්ම පාපය බෙදෙන ප්‍රධාන ආකාර 2 ක ලියන්න
vi. පාපයට ලැබෙන දඬුවම් දෙවර්ගය ලියන්න
vii. 6 හා 9 පනත් ලියන්න
viii. ජුසේවාස් මුනිතුමා කළ ප්‍රාතිහාර්යයන් 2 ක් ලියන්න
ix. ප්‍රසාද ස්තාපනය මගින් කතෝලිකයන් සෑම කෙනෙකුටම හිමි වන ජීවිත තත්ත්වයන් 2 ක ලියන්න
x. භාවනාව තුළ විමසිලිමත් වන ප්‍රධාන කරුණු 2 ක ලියන්න (2 x 10 = 20)

02. i. ශුද්ධ බයිබලයේ එළිදරව්වාදී ග්‍රන්ථ 2 ක් ලියන්න.
ii. නව ගිවිසුමේ ප්‍රධාන පොත් කාණ්ඩ 3 ක් ලියන්න
iii. ශුද්ධ බයිබලය කිතුනු ජීවිතයට වැදගත් වන්නේ කෙසේ දැයි කරුණු 5 කින් දක්වන්න (2+3+5=10)

03. i. ගීතාවලිය ග්‍රන්ථය යොදා ගන්නා ප්‍රධාන අවස්ථා 2 ක් ලියන්න
ii. සමදර්ශක ශුභාරංචි ග්‍රන්ථ තුන හා සංකේත තුන ලියන්න
iii. ජොහාන් ශුභාරංචියේ මම වෙමි ප්‍රකාශ 4 ක් ලියා එකක් පිළිබඳ විස්තර කරන්න (2 + 3 + 5 = 10)

04. i. වීර නායකයන්ගේ මූලික කාර්යය ලියන්න
ii. 'සාමුවෙල්" පිළිබඳ කරුණු 3 ක් ලියන්න.
iii. වීර නායකයන්ගේ ජීවිතවලින් අපට ගත හැකි ආදර්ශයන් 5 ක් ලියන්න (2 + 3 + 5 = 10)

05. i. දේව වරප්‍රසාදය අපට ලැබෙන ආකාරයන් 2 ක් ලියන්න
ii. ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීමට කළ හැකි දේවල් 3 ක් ලියන්න
iii. සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගන්නා ආකාරය කරුණු 5 කින් විස්තර කරන්න(2+3+5+=10)

06. i. ආරම්භක දේව ප්‍රසාද නිධාන 2 ක් නම් කරන්න
ii. ශුද්ධ බයිබලයේ සඳහන් උදාන ගී 3 ක් ලියන්න
iii. අසීසියේ ෆ්‍රැන්සිස් මුනිතුමාගේ යැදුමෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශයන් 5 ක් ලියන්න (2+3+5=10)

07. පහත සඳහන් මාතෘකා 2 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න. (වචන 50 කට වඩා වැඩි විය යුතුය.)
i. වර්තමාන සමාජයේ පාපී ක්‍රියා
ii. නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාව
iii. මිනිස් ජීවිත සුරකිමු
iv. ශුද්ධ වූ දොමිනික් සාවියෝ මුනිතුමා (5 + 5 = 10)

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# කතෝලික ධර්මය - පිළිතුරු පත්‍රය
## 9 ශ්‍රේණිය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 02. | 3 | 03. | 2 | 04. | 2 | 05. | 4 | 06. | 2 |
| 07. | 3 | 08. | 4 | 09. | 4 | 10. | 3 | 11. | 3 | 12. | 1 |
| 13. | 1 | 14. | 2 | 15. | 4 | 16. | 4 | 17. | 4 | 18. | 3 |
| 19. | 1 | 20. | 2 | | | | | | | | |

II - කොටස

01. i. ජෝබ්, ගීතාවලිය, හිතෝපදේශය, ධර්මදේශකයා, ප්‍රේම ගී, ප්‍රඥාව, සිරාක්
ii. යැදුම් පොත, ගී කළඹ, යාච්ඤා පොත
iii ශු. වූ සභාවේ ශුභාරංචිය, දේව රාජ්‍යයේ ශුභාරංචිය
iv. සර්පයා සාප ලැබීම, ජීවිතය පුරාවට උරගා යමින් දූවිලි කෑම
v සුළු පාපය, බරපතල පාපය
vi. සදාකාලික දඬුවම්, කාලීන දඬුවම්
vii. 6 කාමමිථ්‍යාචාරය නොකරව 9 පරදාර ආලය නොකරව
viii.මහනුවරට වර්ෂාව ලබා දීම, තනි අලියෙකු මෙල්ල කිරීම, දැඩුරු ඔයෙන් පාගමනින් එගොඩ වීම
ix. ලෞකික ජීවිතය, සදාතනික ජීවිතය
x. කිතුනු ජීවිතය ගත කළ යුතු ආකාරය (ල. 20)

02. i. දානියෙල්, එළිදරව්ව
ii. ශුභාරංචි හා ක්‍රියා පොත, සංදේශ, එළිදරව් සාහිත්‍යය
iii. දේව වචනයෙන් පෝෂණය කිරීම/ජීවිතයට මඟ පෙන්වීම/බෙදාහදා ගනිමින් ජීවත් වීමට/සතුටින් කාලය ගත කිරීමට/අභියෝගවලට මුහුණ දීමට/අන් අයට ආලෝකයක් වීමට වැනි කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න (2 + 3 + 5 = 10)

03. i. දිව්‍ය පූජාවේ පිළිතුර ගීය සඳහා/යාම යැවුම් සඳහා
ii. මතෙව් ශුභාරංචිය - මිනිසි/මාක් ශුභාරංචිය - සිංහයා / ලූක් ශුභාරංචිය - ගවයා
iii. ජීවනදායක භෝජනය මම වෙමි/බැටළුවන්ට දොරටුව මම වෙමි/ මම යහපත් එඬේරා වෙමි/ පුනර්ජීවනය ද ජීවනය ද මම වෙමි/සැබෑ මිදිවැල මම වෙමි / මාර්ගය ද සත්‍යය ද ජීවිතය ද මම වෙමි. එකක් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (2 + 3 + 5 = 10)

04. i. ඊශ්‍රායෙල්වරුන්ට එල්ල වූ යුද්ධවල දී යුධ නායකත්වය ලබා දීම/ජුදා ජනතාව එක්සත් කරමින් ජාතියක් වශයෙන් ගොඩනැගීමට අවශ්‍ය පදනම සැකසීම
ii. අවසාන විනිශ්චයකාරයාය/දිවැසිවරයෙකි/පූජකයෙකි/සාමුවෙල්, දාවිත්, සාවුල් රජකමට අභිෂේක කළ පුද්ගලයාය
iii. අන් අය වෙනුවෙන් ක්‍රියා කිරීම/අන් අය මුහුණ දෙන ගැටලුවල දී උදව් කිරීම/දෙවියන් වහන්සේට යාච්ඤා කිරීම/දෙවියන් වහන්සේ සමඟ සෑම විටම සිටින බව විශ්වාස කිරීම/අභියෝගවලට මුහුණ දීම/ එඩිතර බව ආදී කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න (2 + 3 + 5 = 10)

05. i. ඉෂ්ට වරප්‍රසාද, අනුග්‍රහ වරප්‍රසාද
ii. යාච්ඤා කිරීම, යහපත් ක්‍රියා කිරීම/දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම
iii. 1. ආත්ම සෝදිසියක යෙදීම
2. කළ වැරදි ප්‍රතික්ෂේප කරමින් දුක් මනස්ථාප වීම
3. නැවත පව් නොකිරීමට ඉටා ගැනීම
4. සියලු පව් පියතුමාට කීම
5. පියතුමා දෙන දඬුවම් ඉටු කිරීම (2 + 3 + 5 = 10)

06. i. ප්‍රසාද ස්තාපනය, අභිවෘද්ධි ආලේපය, දිව්‍ය සත්ප්‍රසාදය
ii. මරිය තුමියගේ උදාන ගීය/සිමියොන් තුමාගේ ප්‍රශංසා ගීය / සිමියොන් තුමාගේ ප්‍රශංසා ගීය.
iii. සාමය වෙනුවෙන් කටයුතු කිරීම/වෛරයෙන් පිරුණු තැනට ප්‍රේමය ද/අසමගි වූවන්ට ශාන්තිය ද/ අවිශ්වාසය ඇති තැනට විශ්වාසය ද/බලාපොරොත්තුව සුන් වූ තැනට බලාපොරොත්තුව ද / ශෝකය ඇති තැනට ප්‍රීතිය ද/ප්‍රේම කිරීමට ද/ ලකුණු ලබා දෙන්න (2 + 3 + 5 = 10)

07. i. වර්තමාන සමාජයේ පාපී ක්‍රියා
මිනිස් ඝාතන, සොරකම, චරිත ඝාතන, පළිගැනීම, ගබ්සාව, යුද්ධය, මත්ද්‍රව්‍ය භාවිතය, අල්ලස් ගැනීම් නොහොබිනා සබඳතා, විවිධ දූෂණ පිළිබඳව විස්තර කරමින් කරුණු ඉදිරිපත් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
ii. නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාව
බාල පුතු පියාගෙන් තමාට අයිති දේ ලබා ගැනීම, මිතුරන් සමඟ එය නැති නාස්ති කර ගැනීම, අවසානනයේ සියල්ල අහිමි වීම, මනස්ථාපනය වීම, පියා වෙත නැවත හැරී ඒම, පියා ආදරයෙන්, කරුණාවෙන් පිළිගැනීම, ආදිය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න
iii. මිනිස් ජීවිත සුරකිමු
ජීවිතය දෙවියන් වහන්සේට අයිති බව, ජීවිතය විනාශ කිරීම, මරණින් පාපයක් හා ස්වර්ගයට මොර ගසන පාපයක් බව, ජීවිතය දෙවියන් දුන් තිළිණයක් ලෙස ආරක්ෂා කර රැක බලා ගත යුතු බව, අපගේ ජීවිත ශුද්ධාත්සයාණන්ගේ මන්දිරය බැවින් ශුද්ධවන්තව තබා ගත යුතු බව ආදී කරුණු විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න
iv. ශු. දොමිනික් සාවියෝ මුනිතුමා
උපත - 1842 අප්‍රියෙල් 2 ඉතාලියේ රිවා මුරි අල්ඩෝ ග්‍රාමයේ
පියා - චාල්ස් සාවියෝ
මව - බ්‍රිජට්
අවුරුදු 7 දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට මිසම්භාර පියතුමාට දැන්වීම
පියතුමා අවු. 12 දක්වා වන තුරු ඉන්නා ලෙස දැන්වීම.
ඔහුගේ භක්තිය ආශාව නිසා, පාස්කුවට එතුමාට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට හැකි වීම
තම වචනයෙන්, ක්‍රියාවෙන් ආදර්ශමත් ජීවිතයක් ගත කිරීම අවු. 15 රෝගාතුරව මරණයට පත්වීම,
මංගල්‍යය මාර්තු 10 එතුමාගේ කොළ පාට බෙන්තිඤ්ඤය ගර්භනී මව්වරුන්ට පහසු දරු ප්‍රසූතියට උදව් වන බව ඔප්පු විම.